## අනගාරික ධර්මපාලතුමන් හා ස්වාමි විවේකානන්ද පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

**මඩුළුගිරිය විජේරත්න**
දෙමළ පණ්ඩිත්

ජාතික අභිවෘද්ධියෙහිලා භාෂාව තරම් ඉවහල් වන වෙනත් දෙයක් නොමැති වුවත් එය ඔපවත් වන්නේ ආගමෙනි. ධර්මයෙහි ඕනෑම ජාතියක සංහිඳියාව ඇති කිරීමට ධර්මය ඉවහල් වී ඇත. මූලික වශයෙන් ධර්මයක ශාස්තෘන් වහන්සේලා එහි හරයන් ලොවට හෙළි කළත් එය කාලයෙන් කාලයට ලොව නොනැසී පැවතීමට ඉවහල් වන්නේ එහි අනුගාමිකයන්ගේ පිහිටයි.

බුද්ධ ධර්මය ඉන්දියාවේ උපත ලැබුවත් එයට නැවත පුනර්ජීවයක් ලබා දීමට අප රටේ පින්වත් පුත් රුවනකට හැකි වීම අපගේ ආඩම්බරයට කරුණකි. ඒ අන් කවරෙකුවත් නොව අනගාරික ධර්මපාලතුමා ය. එතුමා සිංහල ජාතියට පුනර්ජීවයක් ලබා දුන්නා පමණක් නොව, බුද්ධ ධර්මය නගා සිටුවීමට සිය ජීවිතයම කැප කළේ ය.

එමෙන් ම හින්දු ධර්මයට ශාස්තෘන් වහන්සේ නමක් නැති වුවත් මූලික වේද ග්‍රන්ථවලින් බිහි වුවත් කාලයෙන් කාලයට හින්දු ධර්මයද ඉදිරියට ගෙන යන ලද්දේ එහි අනුගාමිකයන් විසිනි. ඒ සඳහා කාලයත්, ධනයත්, ශ්‍රමයත් කැප කළ අයෙක් ගැන සඳහන් කිරීමට ලැබීම මාගේ භාග්‍යයකි. ඒ ස්වාමි විවේකානන්දයන් ය. ඔහු ඉන්දියාවේ උපත ලැබුවත් ලංකාවට ද විශේෂත්වයක් ගෙන දෙන්නේ ලංකාවේ රාමක්‍රිෂ්ණ මිෂම බිහි කිරීමට පමණක් නොව, හින්දු ධර්මයටද කළ අප්‍රමාණ සේවය නිසාය.

මෙම ලිපියේ අරමුණ වන්නේ අනගාරික ධර්මපාලතුමා සහ ස්වාමි විවේකානන්ද ගැන සනසන්දනාත්මකව කරුණු ගෙනහැර පෑමයි.

**දෙදෙනාගේම උපත**

ස්වාමි විවේකානන්ද ඉන්දියාවේ කල්කටාවේ උතුරු ප්‍රදේශයේ 'සිමුලියා' නොහොත් 'සිම්ලා' ප්‍රදේශයේ ශාස්ත්‍රීය පවුලක නඩුකාරවරයෙකු වන විසුවනාද් තත්තර් යන පියාණන්ටත්, පුවනේශ්වරී දේවි යන මෑණියන්ටත් දාව 1863 ජනවාරි මස 12 වන දින නරේන්ද්‍රනාත් නමින් උපත ලැබුවේ ය.

අනගාරික ධර්මපාලතුමාගේ උප්පත්තිය සිදුවන්නේ ලංකාවේ කොළොම් පුරවරෙහි කොටහේනේ දීය. එය 1864 සැප්තැම්බර් 17 වන දින දොන් කරෝලිස් හේවා විතාරණ

ව්‍යාපාරික මැතිතුමාටත් මල්ලිකා ගුණවර්ධන මැතිනියටත් දාව කුළුදුල් පුත් කුමරුවා වූයේ ඩේවිඩ් හේවාවිතාරණ ය.

මෙම දෙදෙනාගේම පවුල් පසුබිම ගැන ගතහොත් අනගාරික ධර්මපාලතුමා ව්‍යාපාරික පවුලකට අයත් වුවත් එතුමාගේ පවුලෙහි සහෝදරියන් තිදෙනෙක් හා සහෝදරයන් දෙදෙනෙක් විය. නමුත් කල්කටාවේ 'සිම්ලා' ප්‍රදේශයේ නඩුකාරවරෙයෙකුගේ වැඩිමහලු පුතා මෙලොව එළිය දකින විටම මෙලොවින් සමුගත්තේ ය. පසුව ගැහැනු දරුවන් හතර දෙනෙකු ලැබුණු අතර එක් පිරිමි දරුවෙක්වත් ඔවුනට නොවී ය. ඊට පසු නඩුකාරතුමා පිරිමි දරුවෙකු පතා තපස් රකින්නට විය. ඔවුන් විශ්වාස කරන පරිදි තපසේ ප්‍රතිඵලයක් හැටියට මෙම පුත් රුවන ඉපදුණු බව කිව යුතු ය.

**අධ්‍යාපනය**

ඩේවිඩ් හේවාවිතාරණ බිළිදාගේ අධ්‍යාපනය ගැන සැලකීමේ දී ඔහුගේ අධ්‍යාපනය ආරම්භ වන්නේ පිටකොටුවේ ලන්සි බාලිකාවන් සඳහා පවත්වනු ලබන බාලිකා පාසලක ය. සය හැවිරිදි වූ කල ඩේවිඩ් කුමරුවාව කතෝලික පාසලකට ඇතුළත් කරන ලද්දේ ය. කතෝලික පාසලෙන් අනතුරුව පෞද්ගලික සිංහල පාසලකින් අධ්‍යාපනය ලැබුවේ ය. එහි දී ඔහුට සිංහල භාෂාව හැදෑරීමේ දුර්ලභ අවස්ථාව හිමි විය. ඉන් අනතුරුව කොටහේනේ ශාන්ත බෙනඩික් විද්‍යාලයට ඇතුළත් විය. එම අබෞද්ධ පාසලෙන් පසු කෝට්ටේ ක්‍රිස්තියන් පාසලේ නේවාසිකාගාරයේ නැවතී ඉගෙන ගත්තේ ය. ඉන්පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළත් කරනු ලැබී ය. මෙහිදී මැට්‍රිකියුලේෂන් විභාගයට පෙනී නොසිට ඉන් ඉවත් වූයේ දීපදුත්තාරාමයේ පුණ්‍යෝත්සවයක් නිමිත්තෙන් පූජා භාණ්ඩ රැසක් සහිතව ගමන් ගත් බෞද්ධ මහා පෙරහැරකට අබෞද්ධයින් කරන ලද පහර දීමක් නිසා ය.
නරේන්ද්‍රනාත්ගේ අධ්‍යාපන කටයුතු ගැන සැලකීමේදී ඔහු මුලින් මූලික අධ්‍යාපනය සඳහා 'තින්නෙයි පල්ලි' නමින් හඳුන්වන ආලින්දයේ පාසලට ගියේ ය. නිවසක ආලින්දයේ ගුරුවරයෙකු විසින් පවත්වන ලද ඉගැන්වීම් මේ නමින් හැඳින්වේ. ඔහුගේ ස්මරණ ශක්තිය ඉතා ඉහළ ය. එක වරක් පාඩම කියා දුන් විට ඔහුට මතක සිටින්නේ ය. 'තින්නෙයි පල්ලි' අධ්‍යාපනයෙන් පසු ඔහු නගරයේ පාසලකට ඇතුළත් කරනු ලැබුවේ ය. එම පාසල වූයේ ඊෂ්වර සන්දිර විද්‍යාසාගර නැමැති පාසලයි.

ඒ දවස එම විද්‍යාලය බෙහෙවින් ජනප්‍රිය පාසලකි. මෙම පාසලට යාමට හේතු වූයේ ඔහුගේ පවුලේ සියලු දෙනාම එම පාසලෙන් ඉගනුම ලැබූ නිසා ය. මෙම පාසලේදී ඔහු ඉංග්‍රීසි දැනුම දියුණු කර ගත්තේය. තවද අවශ්‍ය සියලු දැනුම ලබා ගත්තේ ය. සංස්කෘත, හින්දි, දෙමළ, තෙළිඟු, මලයාල වැනි භාෂා ඉගෙන ගත් බව සඳහන් ය.

**සමාජ මෙහෙවර**

සමෘද්ධිමත් ව්‍යාපාරයක උරුමයෙන් ඉසුරුමත් ජීවිතයකට හිමිකම් ඇතිව සිටි 'ඩේවිඩ්' නම් වූ මේ දුර්ලභ තරුණයා ගිහි ගෙය අතහැර අභිනික්මණේදී ඕල්කට්තුමා විසින් පිහිට වූ පරම විඥානාර්ථ බෞද්ධ සමිති ශාලාව වාසයට තෝරා ගත්තේ ය. නිසැකවම එය බෝධිසත්ව චර්යාවක් අනුගමනය කිරීමක් බව ඔහුගේ පශ්චිම ජීවිතයෙන් පැහැදිලිව පෙනී ගියේ ය. ඒ දක්වා තමන් භාවිත කළ පර හෝ අපර නාමය වන ඩේවිඩ් නම අතහැර ධර්මපාල හේවාවිතාරණ වැළඳගත්තේ ය. එතුමා සුදු රෙද්දෙන් බැනියමෙන් හා උතුරු සළුවෙන් සැරසී බෞද්ධෝපාසක වේශයට පත් වූයේ ය.

හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ දේශනයක් අසාගෙන ක්‍රියාශීලීත්වයෙන් මහත් ප්‍රබෝධයකට පත් ඩේවිඩ් තරුණයා පරම විඥානාර්ථ සමාගම විසින් ආරම්භ කරන ලද 'සරසවි සඳරැස' පුවත්පතේ දියුණුවට හා ජාතිය නංවාලීමට මුළුමනින් ම කැපවීමක් කළේ ය. තම දැනුම පුළුල් කරගැනීමට පිටකොටුවේ පුස්තකාලයට ගොස් දැනුම පුළුල් කර ගනිමින් සරසවි සඳරැස පුවත්පතේ සෑම කටයුත්තකටම අතහිත දුන්නේ ය.

ධර්මපාල තරුණ වීරයාගේ නැණස සිංහල දේශයේ හා ජාතියේ දුක්බර තත්ත්වය දෙසට වැඩියෙන් විවර වූයේ දූරදර්ශී සෙන්පති ඕල්කට්තුමා නැවත ලක්දිවට පැමිණි 1885 න් පසුව ය. ශාසනික හා අධ්‍යාපනය අතින් සිංහල ජනතාව වැටී සිටි සංවේද ජනක තත්ත්වය ගැන දුක් වූ මේ ආගන්තුක සත්පුරුෂයා රටේ ගම් නියම් ගම් සැරිසරා බෞද්ධයන් අවධි කොට සෑහෙන අරමුදලක් ඇති නොකොට බෞද්ධ අධ්‍යාපනයක් ආරම්භ කරන්නට නොහැකි බව තේරුම් ගත්තේය. මාස කිහිපයක් අගනුවරින් බැහැර වූ රටේ චාරිකාවේ යෙදීමටත් ඕල්කට්තුමාගේ චතුර ඉංග්‍රීසි දේශන සිංහල බසට පරිවර්තනය කිරීමටත් කිසිඳු වැඩිහිටියෙකු හෝ තරුණයෙකු ඉදිරිපත් වූයේ ද එවකට අනගාරිකව සිටින ධර්මපාල තරුණයා ය.

ස්වාමි ශ්‍රී රාමක්‍රිෂ්ණන්ගේ සෙවනැල්ලෙහි 'නරේන්ද්‍රනාථ'

ස්වාමි ශ්‍රී රාමක්‍රිෂ්ණන් සාධාරණ හින්දු ලබ්ධිකයෙකු නොවේ. ඔහු සමථ ධ්‍යානලාභියෙකි. මොහුගේ සෙවන නරේන්ද්‍රනාථට ලැබිණි.

නරේන්ද්‍රනාථ හමුවූ මුල් දවසේ ම ශ්‍රී රාමක්‍රිෂ්ණන් ස්වාමිතුමාට ඔහු තමාගේම පුත්‍ර රත්නයක් යැයි හැඟී ගියේ ය. එනිසාම තමන්ගේ ධ්‍යාන වැඩීම ගැන සම්පූර්ණ පුහුණුවක් ලබා දුන් අතර ශ්‍රී රාමක්‍රිෂ්ණන්ගේ සියලූ ආගමික හා සමාජ සේවා කටයුතු ඔහුට භාර කළේ ය. ශ්‍රී රාමක්‍රිෂ්ණන් ස්වාමිගේ ඊශ්වරකෝඩි, ජීවකෝඩි යන ශිෂ්‍යයන් දෙවර්ගයකට බෙදා තිබුණේය. මෙයින් නරේන්ද්‍රනාථ අයත් වූයේ ඊශ්වරකෝඩි යන ශිෂ්‍යයන් කොටසට ය. ඔහු බ්‍රහ්මචාරි ජීවිකාවක් ගත කරමින් ඔහුගේ මෑණියන් වන පුවනේශ්වරී දේවි විසින් බලන ලද භාර්යයාව පවා රාමක්‍රිෂ්ණන් ස්වාමිතුමාගේ මැදිහත් වීමෙන් ප්‍රතික්ෂේප කළේය. මෙසේ බ්‍රහ්මචාරී

ජීවිතයක් ගත කරමින් වීරියෙන් උත්සාහයෙන් කටයුතු කළේ ය. ඉන් පසු ඔහු තම නිවසට නොගොස් වෙනම ම ආරණ්‍යයක තපස් සුවයෙන් ගත කළේ ය.

## අලුත් තපස් ආරණ්‍යයක්

රාමක්‍රිෂ්ණතුමාගේ ආශ්‍රයට වැටී එතුමාගේ අඩිපාරේ යමින් අනෙක් ශිෂ්‍යයන් සමග කල්කටාවේ 'වරාග නගර්' යන නගරයේ ඉතා පාළු ගෙයක් තපස් රැකීමට ආරණ්‍යයක් ඇති කරමින් එහිදී 'සමථ' භාවනාවේ උච්ච ඵලයට පැමිණි ඔහු තවත් මිතුරන් 16 දෙනෙක් සමග පැවිදි බිමට පැමිණියේ ය. එම පැවිදි බිමේ දී ඔහුගේ නම වූයේ ස්වාමි විවිතිෂානන්දර් ය. ඊට පසු ඔහු තම නම දෙවතාවක් මාරු කළේ ය. එනම් 1891 පෙබරවාරි මස සිට 1892 ඔක්තොම්බර් මාසය තෙක් "විවේකානන්දර්" යනුවෙන් ද 1892 සිට 1893 මැයි දක්වා " සච්චිදානන්දර්" යනුවෙන් ද 1893 මැයි මාසයේ සිට බටහිර රටවල ප්‍රසිද්ධ වීමට ස්ථිර වශයෙන්ම "විවේකානන්දර්" යනුවෙන් වෙනස් කර ගත්තේ ය.

## උපන් මව්බිමේ චාරිකා

ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත්වල අනගාරික ධර්මපාලතුමා සිංහලයන් දැනුවත් කිරීමෙන් ඔහු විශේෂයෙන් සාදවන ලද තට්ටු දෙකේ අමුතු ගැලක් ඕල්කට්තුමාගේත් ඔහුගේ අනුගාමික ලෙඩ් බිටර් මහතාගෙත් ධර්මපාල තරුණයාගේත් වාහනය විය. එතෙක් රටේ කොතැනකවත් නොතිබුණු බෞද්ධ අධ්‍යාපනයක් සඳහා බෞද්ධයන්ගේ උපකාරය පතමින් ඕල්කට්තුමා මේ ගමනේ දී කළ චතුර ඉංග්‍රීසි දේශනා ඉතා දක්ෂ ලෙස සිංහලයට අනුවාදය කළ ධර්මපාල තරුණයා පරාධීන සිංහල ජාතිය වැටී සිටි තත්ත්වයන් ගම් දනව්වල දුක්ඛිත තත්ත්වයන් ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගත්තේය. ජාතියට පුනර්ජීවයක් දී ශාසනය නගාසිටුවීමේ චේතනාව එතුමන් තුළ කුළු ගැන්වූයේ මේ චාරිකාවේදී ය. විදේශික බලවේගයට හසු වී අසරණව සිටීම විනා උන්නතිකාමය පිළිබඳ සහජ හැකියා නොදන්නා ජනතාව අනාගතය සකස් කර ගැනීමේ මග පෙන්වීම ඔහුගේ ප්‍රාර්ථනය විය. පරාධීනත්වයෙන් මිදී ජාතියේ හා ශාසනයේ අතීත ශ්‍රී සමෘද්ධිය යළිත් පහළ කර ගැනීමේ සංකල්පය ජාතියට කාවැද්දිය යුතු බව ඔහුට මේ ගමනේදී අවබෝධ විය.

## බෞද්ධ පාසල්

ඕල්කට්තුමාගේ හා ලෙඩ් බිටර් මහතාගේ පුරෝගාමීත්වයෙන් ධර්මපාලතුමාගේ සහභාගිත්වයත් ඇතිව මුලින් ඇති කරන ලද ඉරිදා පාසල් සමූහයෙන් ප්‍රධාන එකක් කොළඹ ඉංග්‍රීසි බෞද්ධ විද්‍යාලයක් බවට පරිවර්තනය විය. ලංකාවේ බෞද්ධ විද්‍යාලයන් අතර මුල් තැන ගත් ආනන්ද මහ විදුහල වූයේ එම පාසලයි. වසර කිහිපයක් ගත වන විට පරම විඥානාර්ථ සමාගම පිහිටුවා පාලනය කළ බෞද්ධ පාසල් ගණන 50 සීමාව ඉක්මවිය. ඒ පාසල් පාලනයේ දී ධර්මපාලතුමා ප්‍රධානත්වයෙන් සැලැස්මෙන් ලක්දිව බෞද්ධ අධ්‍යාපනයේ පුරෝගාමියා වූයේ ය.

**බුද්ධගයාව බේරාගැනීම**

එතුමා බුද්ධගයා මහ බෝමැඩට පිවිසුණේ 1890 වසරේ දෙසැම්බර් 5 වෙනිදා ය. 'මහන්තා' නම් වූ හින්දු භක්තිකයාගේ අණසකට පත්ව පැවති බුද්ධගයා මහා විහාරය හා මහ බෝ මැඩ බෞද්ධයන් උදෙසා නිදහස් කර ගැනීමේ අධිෂ්ඨානය මුවින් ද උසුරුවමින් වජ්‍රාසනාව තිබූ තැන නළල තබා වැඳ කඳුළු වැගිරුවේ ය. එය මුදවා බෞද්ධයින්ට වන්දනාමාන කිරීමට උරුම කර දෙන බවට අදිටන් කර ගත්තේය. මේ සඳහා ඔහු "මහා බෝධී" නමින් සමිතියක් පිහිටුවා ගත්තේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද බුද්ධගයාව අපට උරුම වී ඇත.

කල්කටාවේ උපත ලද ස්වාමි විවේකානන්දයන් හින්දු ධර්මය නගා සිටුවීමට කල්කටාවේ දී රාමක්‍රිෂ්ණ මඩමක් ආරම්භ කරන විට ම 1896 දී ධර්මපාලතුමන් බෞද්ධ මධ්‍යස්ථානයක් එහිදී පිහිටු වීම වැදගත් ය. කල්කටාවේ දී මහා බෝධි සමාගමේ ශාඛාවක් පිහිටුවා එමගින් " මහා බෝධි" නමින් ඉංග්‍රීසි සඟරාවක් අරඹා ලෝකයේ නොයෙක් රටවලට බුද්ධ ධර්මය හා බෞද්ධ තොරතුරු විසුරුවා හැරියේ ය. එමෙන්ම ලංකාවේ 1906 දී සිංහල බෞද්ධයා පුවත්පත ඇරඹීම ද වැදගත් ය. එම පුවත්පත ශාසනයේ බෞද්ධ බලයක් බවට පත්විය.

**ඉන්දියාවේ චාරිකා**

ස්වාමි විවේකානන්දතුමන් ඉන්දියාව පුරා ඇවිද ඉන්දියාවේ තත්ත්වය මනාව අවබෝධ කර ගනිමින් විදේශිකයන්ගේ ආධිපත්‍යයෙන් ඉන්දියාව වහලුන් වී සිටීමත් අනෙක් ප්‍රතිසංස්කරණවාදීන් මෙන් සමාජය යහමගට හැරවීම සඳහා ධර්මයේ නියමයෙන් දේශපාලන මිථ්‍යා විශ්වාස ගොඩනැගෙන බව ඔහු පෙන්වා දුන්නේ ය. එමෙන් ම පාලකයින් හමු වී ඔවුන්ගේ කාර්යභාරය විය යුත්තේ කුමක්ද යන්න ඔහු පෙන්වා දුන්නේ ය. ඉතා පිටිසර බද ගැමි ජීවිත උසස් කරලීමට තම සහෝදර ශ්‍රමණයන් සමඟ ජීවිතය කැප කරන්නට විය.

ඉන්දියාව පමණක් නොව ලෝකයටම පොදු වූ මිනිසෙකු තමා යැයි තේරුම් ගත් එතුමා පිටරටවල ද හින්දු ධර්මයේ ඇති ධ්‍යාන ගැන කියා දීම සඳහා චාරිකාවල යෙදීම වැදගත්ය. ඒ අනුව ශ්‍රී ලංකාව, ඇමරිකාව, සිංගප්පූරුව, හොංකොං රාජ්‍ය, ජපානය, එංගලන්තය, යුරෝපය වැනි රට වලට චාරිකා කරමින් හින්දු ධර්මය දේශනා කළේ ය.

තවද ඉන්දියාවේ එවකට පළවූ පුවත්පත් එතුමාව නොයෙක් ආකාරයෙන් වැරදි ලෙස ප්‍රවෘත්ති දෙන විට ඉන් නොසැලී ඒවා නිවැරදි කිරීමට ස්වාමි ජී ට හැකි විය. එමෙන්ම මුදල් අගහිඟ කමින් පෙලෙමින් සිටි කාලය ද සුළුපටු නොවේ. ඉන් පසු එක් අවස්ථාවක් හැටියට ඇමරිකාවේ පැවති සියලු ආගමික සම්මේලනයට යාමට ඔහුට මුදල් නොමැති වීම සැලකිය හැකි ය. නමුත් එය ව්‍යර්ථ කරමින් ජාන් හෙන්ඩ්‍රි රෙඩ්ඩි මාර්ගයෙන් ඔහුට මුදල් ලැබුණේ ය. එය ඔහු විශ්වාස කරන්නේ රාමක්‍රිෂ්ණතුමා උදව් කළ බව ය.

මෙතුමා ඉන්දියාවටත් ලෝකයටත් කළ සේවය අගය කිරීමට අද ද ඉතිරිව ඇත්තේ ඉන්දියාවේ, කල්කටාවේ, දිල්ලියේ, චෙන්නායි, ශ්‍රී ලංකාවේ පිහිටු වන ලද රාම ක්‍රිෂ්ණ මිෂමය.

**දෙදෙනාගේම සමානතා**

අනගාරික ධර්මපාලතුමාත් ස්වාමි විවේකානන්දතුමාත් බටහිර සිරිත් විරිත් ඇඳුම් පැලඳුම් ආදියට අකමැතිව කටයුතු කළෝය. එයින් දේශීයත්වය වැනසී යන බව සමාජයට කියා දුන්නෝ ය. මේ සම්බන්ධව දෙදෙනාම හැසිරෙන ආකාරය සමාන බව පෙනී යයි. ඒවාගේම මිෂනාරීවරුන් තම ධර්මය පතුරවමින් ලාංකීය සමාජයටත්, ඉන්දීය සමාජයටත් කළ හානිය වැළැක්වීමට ඒ ඒ සමාජවලදී නොයෙක් තැනවල නිවැරදි කිරීමට කටයුතු කර ඇත. කිතු දහමට වඩා හින්දු ධර්මයේ ඇති ධර්ම කරුණුවල උසස් තැන් කිරීමට ස්වාමි විවේකානන්ද තුමා සමත් වී තිබේ. ජාතිය බුද්ධ ධර්මය ගැන නිර්භයව කතා කළේ අනගාරික ධර්මපාලතුමාය. "සිංහලයින් බුද්ධගයාව බේරා ගනිව්" යන අභීත කාහල නාදයෙන් සිංහල බෞද්ධයන් එදා අවදි කළේ ය. ස්වාමි විවේකානන්දයන් ඉන්දියානු ජනතාව අවදිකළේ ද මෙසේ ය. භාරත දේශයේ ජනතාවෙනි, නැගී සිටිව් ඔබේ ආත්මීයත්වයෙන් ලොවම දිනා ගනිව් යනුවෙනි.

**අනගාරික ධර්මපාලතුමාගේත් ස්වාමි විවේකානන්දගේත් හමුවීම**

1893 වර්ෂය උදාවිය. විසි වන වියේ සිටි ධර්මපාලතුමාගේත් විසි එක්වන වියේ පසු වූ විවේකානන්දතුමාගේත් ඓතිහාසික හමුවීමක් ඇමරිකාවේ චිකාගෝ නුවරදී සිදු විය. ඒ එහි පැවති දෘෂ්ටි සම්මේලනයේ දී ය. අනගාරික ධර්මපාලතුමා ජාත්‍යන්තර සම්මේලනය හමුවේ සම්බුද්ධ චරිතය, චතුරාර්ය සත්‍ය හා ආර්ය අෂ්ඨාංගික මාර්ගය විවරණය කරමින් අඛණ්ඩව ගලා බස්නා අමා දිය දහරක් මෙන්ම එතුමන් කළ දේශනයෙන් මුළු මහත් ස්ත්‍රී පුරුෂ සමූහයා ම වශීකෘත කළේ ය. එහිදී අනගාරික ධර්මපාලතුමා ලෝකයාගේ අවධානයට ලක්විය.

මේ ආකාරයෙන්ම ස්වාමි විවේකානන්දතුමා ද සභාව ඇමතී ය. එතුමා "සුවයත් සැනසීමත් ගෙන දෙන ඔබගේ ආරාධනයට පිළිතුරු දීමට මේ මොහොතේ ඔබ ඉදිරියේ පෙනී සිටිමි. මාගේ හදවත සතුටින් ඉපිල යනවා. එය පිට කරගැනීමට මට වචන නැහැ. ඉතා පැරණි ශ්‍රමණ පරම්පරාවක නාමයෙන් ඔබට ස්තුති වන්ත වෙනවා." ආදි වශයෙන් සඳහන් කළ කතාවේ මෙසේද සඳහන් වේ. "භේද භින්න වීම් ආගමික උන්මත්තක වීම් වැනි කරුණුවලට එරෙහිව එක් සමාජයක් බිහිවිය යුතුය. ඒ සියල්ලම විනාශ කිරීමේ කාලය ඇවිත් තිබේ." යනුවෙන් දීර්ඝ කතාවක් කළ එතුමා සභාවේ අවධනයට යොමු විය.

ඔහු එක්තරා අවස්ථාවක පැවසුවේ "හින්දු ධර්මයේ පෙනෙන්නට ඇති කෝවිල් පූජා විධි සියල්ලක්ම බුදු දහමෙන් පැමිණි ඒවාය. ඒවාගේම හින්දු ආගමේ සමහර පැති හින්දු ධර්මයෙන් බුදු දහමට පැමිණි ඒවා ය. එම නිසා බුදු දහම නොමැතිව හින්දු දහමටත් හින්දු දහම නොමැතිව බුදු දහමටත් පැවතිය නොහැක." යන්නයි.

**දෙදෙනාගේම අවසානය**

ඉන්දියාව පුරාවට විශාල මෙහෙයක් සිදු කරමින් මිෂනාරි මඩම් තනවා ඉන්දියානු ජනතාවට මෙන්ම හින්දු ධර්මයට ස්වාමි විවේකානන්ද තම ජීවිතයම කැප කළේ ය. තම ජීවිත කාලය ම ජනතාව වෙනුවෙන් කැප කොට ජීවිතයේ මතක සටහන් මෙන් ඉන්දියාවේත්, ලංකාවේත් රාමක්‍රිෂ්ණ විශ්‍රාම ශාලා බොහෝමයක් ඇති කරමින් 1902 ජූලි මාසයේ 4 වන දින රාත්‍රී 9.00 ට ඔහු සදහටම මෙලොවින් සමුගත්තේ ය. ඔහු මෙලොවින් සමුගන්නා විට ඔහුගේ වයස අවුරුදු තිස් නවය කි. මේ තරම් කෙටි කාලයක් තුළ ජීවිතය අමරණීය වන්නට හින්දු ධර්මයෙන් ජනතාවට කළ සේවය අප්‍රමාණ ය.

මේ ආකාරයෙන්ම අනගාරික ධර්මපාලතුමාගේ ජීවිතය අවසන් වීම වැදගත් ය. ජාතිය වෙනුවෙන් දහම වෙනුවෙන් අනන්ත අප්‍රමාණ සේවයක් කළ මෙතුමා සත්තිස් පනස් වියේ සිටිමින් තම ජීවිකාව පැවිදි බිමෙන් අවසන් කිරීමට සිතූ ධර්මපාලතුමා 1931 දී විද්‍යෝපාද පිරිවෙනෙහිදී ගිහි පැවිදි ජනතාවට අවසන් දේශනය කොට දඹදිව බලා නික්ම ගොස් එම වසරේම සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදිව 1933 ජනවාරි 16 වනදා ලක්දිවෙන් වැඩම කරන ලද මහ නායක හිමිවරුන් ඇතුළු මහෝත්සවයක දී බරණැස මූලගන්ධ කුටි විහාරයේ දී අධිශීල සංඛ්‍යාත හා උපසම්පදා කර්මයට ඇතුළත් විය. ඉන් දෙමසක් ඉකුත් වන්නටත් කලින් ගිලන් වූ උන්වහන්සේ තම පැවිදි අනුශාසක හික්කඩුවේ ශ්‍රී සුමංගල සංවත්සර දිනය වන අප්‍රේල් 29 බෞද්ධ ලෝකයා ම සුවපත් කරමින් අවසන් හුස්ම හෙළන විට උන්වහන්සේගේ වයස අවුරුදු 69 විය.

මේ අභීත පුද්ගලයන් දෙදෙනා ම මුළු ලොවට කළ සේවය සැමට ම ආදර්ශයක් සේම ඔවුන් ප්‍රාර්ථනා කරන මෝක්ෂ සුවය ලබා ගන්නට මේ පින් මදි නොවේ යැයි අපගේ හැඟීමයි.